ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය
சிரேஷ்ட பிரதி பொலிஸ்மா அதிபர் காரியாலயம்
OFFICE OF THE SENIOR DEPUTY INSPECTOR GENERAL OF POLICE
උතුරු පළාත, කන්කසන්තුරය
வட மாகாணம், காங்கேசன்துறை
NORTHERN PROVINCE, KANKESANTHURAI


මගේ අංකය / எனது இல / My No: S/DIG/NP/04/6402/22
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.10.25


දුරකතන අංකය / தொலைபேசி / Telephone: 021-2059901 ෆැක්ස් / பக்ஸ் / Fax: 021-2220008 විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail: sdig.np@police.gov.lk


සභාපති,
ජාතික ගමනාගමන කොමිෂන් සභාව,
අංක 241,
උද්‍යාන පාර,
කොළඹ - 05.

**යාපනය - කොළඹ ගමනාන්ත අතර මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව**

2022.10.25 දින අංක 33, බොස්වල් පෙදෙස, කොළඹ - 06 ලිපිනයේ පදිංචි ජෝෂප් ගුණනායගම් පැට්‍රික් මහතා මාගේ කාර්යාල වෙත පැමිණ, ඔහුට අයත් අංක WPNG 5171 දරණ බස් රථය සඳහා කොළඹ - යාපනය ගමනාන්ත අතර මගී ප්‍රවාහනයේ යෙදීමට බලපත්‍රයක් ලබාගෙන ඇති නමුත් තම බිරිඳට අයත් අංක WPNC 6909 දරණ බස් රථයට එකී ගමනාන්ත අතර මගී ප්‍රවාහන කටයුතු සඳහා ඉල්ලුම් කල බලපත්‍රය නිකුත් නොකිරීම මත අදාළ බස් රථ වලට ලීසිං වාරික ගෙවා ගැනීමට නොහැකි වීම හේතුවෙන් දුෂ්කරතාවකට පත් ව ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සහනයක් සලසා දිය හැකි නම් එය ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

02. තව ද ඉහත සඳහන් අය විසින්, බිරිඳට අයත් බස් රථය ලීසිං පහසුකම් යටතේ මිල දී ගැනීමට පෙර ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පූර්වගාමී සභාපති වෙතින් විමසීමේ දී යාපනය - කොළඹ අතර මගී ප්‍රවාහන බලපත්‍රයක් ලබා ගැනීමට හැකියාව ඇති බව සඳහන් කල බැවින් ඒ සම්බන්ධයෙන් විශ්වාසය තබා එකී බස් රථය මිල දී ගනු ලැබූ බව වැඩි දුරටත් සඳහන් කරන ලදී.

03. දෛනික ව යාපනය - කොළඹ ගමනාන්ත අතර සංඛ්‍යාත්මකව ඉහළ මගීන් ප්‍රමාණයක් ගමන් ගන්නා බව පොලිසිය වෙත නිරීක්ෂණය වී ඇති අතර ඊට සරිලන පරිදි විශේෂයෙන්ම කි.මී. 400 කට අධික දුර ප්‍රමාණයකින් යුතු මෙම ගමන් වාරයක් සඳහා දුෂ්කරතාවකට පත් නොවන අයුරින් සුවපහසු ආකාරයෙන් මගීන්ට ගමන් කිරීමට ප්‍රමාණවත් බස් රථ සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන බවක් නිරීක්ෂණය නොවේ.

04. මෙම කරුණ සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පති / යාපනය දිසාව විසින් මා වෙත ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුව යාපනය - කොළඹ ගමනාන්ත අතර මගී ප්‍රවාහනය සඳහා සුඛෝපභෝගී බස් රථ 13ක් සඳහා බලපත්‍ර නිකුත් කර ඇති බව ඔබ කොමිෂන් සභාව විසින් දන්වා ඇති අතර එම බලපත්‍ර ලත් බස් රථ වලට අමතරව බලපත්‍ර නිකුත් කර නොමැති වෙනත් සුඛෝපභෝගී බස් රථ 08ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් මගී ප්‍රවාහන කටයුතු වල නිරත ව සිටින බව පොලිසිය වෙත නිරීක්ෂණය වී ඇත.

05. උතුරු පළාතේ පදිංචිකරුවන් සැලකිය යුතු පිරිසක් විදේශ රටවල සේවය කරන බැවින් සහ පදිංචි ව සිටින බැවින් ඔවුන් ලංකාවට පැමිණීමේ දී මෙන් ම ආපසු අදාළ රටවල් වෙත යාම සඳහා කටුනායක ගුවන් තොටුපල වෙත යාම් ඊම් සිදු කිරීම, විශේෂඥ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා කොළඹ පිහිටි ජනප්‍රිය රෝහල් වෙත යාම ඊම් සිදු කිරීම වැනි තත්වයන් යටතේ ඔවුනට නිසි වේලාවට ගමනාන්ත වෙත ගමන් කිරීමට අවස්ථාව සලසා දීමට මෙන් ම වත්මන් ප්‍රවණතා අනුව කොළඹ සහ යාපනය අතර ගමන් ගන්නා මගීන් සංඛ්‍යාව ඉහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය

වන බැවින් එකී මගීන්ට දුෂ්කරතාවකට පත් නොවී සුවපහසු ආකාරයෙන් ගමන් කිරීමට අවස්ථාව සැලසීම සඳහා දැනට ක්‍රියාත්මක බස් රථ සංඛ්‍යාව වැඩි කිරීම සුදුසු බව නිරීක්ෂණය වේ. ඡේද අංක 04හි සඳහන් පරිදි මේ වන විට මාර්ග බලපත්‍ර රහිත ව බස් රථ 08ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් මගී ප්‍රවාහනයේ යෙදීම තුලින්ම මාර්ග බලපත්‍ර නිකුත් කර ඇති බස් රථ සංඛ්‍යාව අවශ්‍යතාවට ප්‍රමාණවත් නොවන බව තහවුරු වේ.

06. තවද උතුරු පළාතේ සේවයේ නියුතු පොලිස් සහ ත්‍රිවිධ හමුදා සාමාජිකයින් වැඩි පිරිසක් විසින් ගමනාගමනය සඳහා මෙම පුද්ගලික බස් රථ භාවිතා කිරීම ද මගීන් සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීමට හේතු වී ඇත. දැනට කන්කසන්තුරය - කොළඹ අතර සුඛෝපභෝගී දුම්රියක් ක්‍රියාත්මක වන නමුදු එම දුම්රිය කලින් ආසන වෙන් කර ගත් මගීන්ට පමණක් සීමා කර ඇත.

07. එමෙන්ම වත්මන් ආර්ථික අවපාත තත්වය යටතේ මගී ප්‍රවාහන ව්‍යාපාරයේ නිරත ව්‍යාපාරිකයින්ට, ස්වකීය බස් රථ සඳහා ලීසිං වාරික ගෙවීම් කිරීමට නොහැකි වීම වැනි ඇති වී ඇති දුෂ්කරතා අවම කිරීමට විසඳුමක් වශයෙන් ඔවුන් සතු අදාළ බස් රථ සඳහා ඉල්ලුම් කර ඇති මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම හෝ තාවකාලික මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම මගින් එම ව්‍යාපාරිකයින්ට මෙන්ම මගීන්ට ද සහනයක් සැලසේ.

08. ඉහත කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර කොළඹ - යාපනය අතර මගී ප්‍රවාහන කටයුතු විධිමත් කිරීම සඳහා පහත යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව වාර්තා කරමි.

i. මගී ජනතාව මෙන්ම අදාළ ව්‍යාපාරකයින් අපහසුතාවට පත්වීම වැළකෙන පරිදි විධිමත් ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීම

ii. දැනට බලපත්‍ර ලබා දී ඇති බස් රථ සංඛ්‍යාව අවශ්‍යතාවට ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වන බැවින් මේ වන විට බලපත්‍ර රහිතව මගී ප්‍රවාහනයේ යෙදෙන බස් රථ වලට ප්‍රමුඛතාව හිමි වන පරිදි හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයක් යටතේ එම බස් රථ සංඛ්‍යාව වැඩි කිරීම සඳහා ඉල්ලුම් කරුවන් වෙත අලුතින් මාර්ග බලපත්‍ර හෝ තාවකාලික මාර්ග බලපත්‍ර නිකුත් කිරීම

iii. බලපත්‍ර සහිත ව මගී ප්‍රවාහනයේ යොදවා ඇති බස් රථයක් කාර්මික දෝෂයකට පත් ව ඇති අවස්ථාවක අදාළ බලපත්‍ර ලාභියා සතු ව වෙනත් බස් රථයක් ඇත්නම් එම රථය, කාර්මික දෝෂයට ලක් වූ බස් රථය වෙනුවට මගී ප්‍රවාහනයේ යෙදවීමට අවස්ථාව සලසා දීම.

09. මහජනයාගේ මෙවැනි ගැටළු සම්බන්ධයෙන් මැදිහත් ව ක්‍රියා කිරීමේ වගකීමක් පොලිසිය වෙත පැවරී ඇති බැවින් මෙම කරුණට අදාළ ව පොලිසිය සමග සම්බන්ධීකරණයෙන් යුතු ව ක්‍රියා කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සුදුසු නිලධාරීන් කණ්ඩායමක් පත් කර ලෙස ද, ඉහත යෝජනා වලට අදාළව ගත් පියවර සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස ද, ඉල්ලා සිටිමි.

10. තව ද යාපනය - කොළඹ ගමනාන්ත අතර මගී ප්‍රවාහනයේ යෙදීම සඳහා සුඛෝපභෝගී බස් රථ 13කට බලපත්‍ර ලබා දී ඇති බව ද, බලපත්‍ර රහිත ව බස් රථ 08ක් පමණ මගී ප්‍රවාහනයේ යෙදෙන බව ද නි.පො.ප. / යාපනය දිසාව ගේ වාර්තාවේ සඳහන් ව ඇතත් එම බස් රථ ප්‍රමාණයට වඩා වැඩි සංඛ්‍යාවක් මගී ප්‍රවාහනයේ යෙදෙන බව නිරීක්ෂණය වී ඇති බැවින් මාර්ග බලපත්‍ර නිකුත් කර ඇති වාහන සම්බන්ධයෙන් වාහනයේ අංකය, හිමිකරු ගේ තොරතුරු, මාර්ග බලපත්‍ර අංකය ආදි තොරතුරු අතුළත් යාවත්කාලීන වාර්තාවක් ලබා දෙන ලෙස ද කාරුණිකව ඉල්ලා සිටිමි.

ප්‍රියන්ත වීරසූරිය,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
උතුරු පළාත.

නිතීඥ ප්‍රියන්ත වීරසූරිය
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
උතුරු පළාත